# ගොවියාට තැන දී ගොවිතැන නංවමු

ශ්‍රී ලංකාවේ වාරිමාර්ග පද්ධතීන් වැඩදායි ලෙස උපයෝගී කර ගැනීමේදී උද්ගත වී ඇති ඇතැම් ආර්ථික හා කළමණාකරණ ගැටළු වාරිමාර්ග පදනම් කර කෘෂිකාර්මික සංවිධානයෙහි ලා අභියෝගයක්ව පවතී වාරිමාර්ග පද්ධතීන්ගෙන් උපරිම ඵල නෙළාගැනීම සඳහා දරන ප්‍රයත්න කෙරෙහි මෙම ගැටළු අහිතකර ලෙස බලපානු ලැබේ. කෙසේ වුවද මෙතෙක් අප ලබා ඇති අත්දැකීම් වලින් එක් කරුණක් පැහැදිලිවේ. එනම් වාරි මාර්ග පද්ධති වලින් උපරිම ඵල ප්‍රයෝජන නොලැබී යාමට මූලික හේතුව මානව සම්පත් සැළසුම් කරණය හා කලමනාකාරිත්වය අංග සම්පූර්ණ නොවීමත් හුදෙක් ආයෝජනය පමණක්ම පදනම් කරගත් තාක්ෂණික සංවර්ධනය ඵලදායි නොවීමත්ය.

මෑත කාලයේදී වී නිෂ්පාදනයේ වැඩිවීමට මූලික වශයෙන් හේතු වූයේ වැඩි අස්වැන්නක් ලබා දෙන වී වර්ග වැපිරීම මිස භූමි හා ජල සම්පත් උපරිම මට්ටමින් උපයෝගී කරගෙන අතිරේක නිෂ්පාදන ධාරිතාවන් වර්ධනය වීම නොවේ. ඇත්ත වශයෙන්ම මෙම අංශයේ දැනට ක්‍රියාත්මක වන වැඩ පිළිවෙලෙහි එක් වැදගත් උපාය මාර්ගයක් නම් වාරි මාර්ග පද්ධතීන්හි නිෂ්පාදන හැකියාව හා පවත්නා සත්‍ය නිෂ්පාදනය අතර ඇති පරතරය අඩු කිරීමය. මෙම වැඩ පිළිවෙලින් පැහැදිලි වන්නේ තාක්ෂණය ප්‍රායෝගික වශයෙන් උපයෝගී කර ගැනීමෙන් භෝග නිෂ්පාදනයේ උපරිම මට්ටම කරා අප පැමිණ ඇති බවත් නිෂ්පාදනය තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා වාරිමාර්ග කළමනාකාරිත්වය හා අදාළ ආයතනික කටයුතු ඒකාබද්ධ කළ යුතු බවත්ය.

මේ බලාපොරොත්තුව ඉටු කර ගැනීමෙහිලා උපයෝගී කර ගත හැකි අර්ථවත් ක්‍රියා මාර්ගය වාරිමාර්ග පද්ධති කලමනාකරණයේ දී සහ ඒ පිළිබඳ තීරණ ගැනීමේදී ගොවි සහභාගිත්වය ලබා ගැනීමය. මෙහිලා ගොවීන් සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රයද අදාල නිලධාරීන් අතර සම්බන්ධතාවයක් ගොඩනගාගත හැකි අයුරු සළකා බැලිය යුතුවේ. තීරණ ගැනීම් කාර්යයේදී ගොවීන් සම්බන්ධ කරවා ගැනීමේ අවශ්‍යතාවය පැහැදිලි කරගත යුතු අතර එම කාර්යයේදී ගොවීන් සම්බන්ධකරවා ගැනීමේ අවශ්‍යතාවය පැහැදිලි කරගත යුතු අතර එම කාර්ය භාරය දැරීම පිණිස ගොවි ජනතා ශක්තිය හා හැකියාව වර්ධනය කර ගැනීම සඳහා කිසියම් වැඩ පිළිවෙලක්ද ඒ සමගම ක්‍රියාත්මක කළමනාය.


**ගොවි කටයුතු පර්යේෂණ හා**

**පුහුණු කිරීමේ ආයතනයේ**

**අධ්‍යක්ෂ**

**ජේ. අල්විස් විසිනි**


ශ්‍රී ලංකාව මෙතෙක් ලබා ඇති අත්දැකීම් වලින් පැහැදිලි වන්නේ ගොවි කුසලතා වර්ධනය කිරීමෙහි ලා රාජ්‍ය අංශයේ සංවිධාන වලට වඩා ස්වේච්ඡා සංවිධාන වලට හැකියාවක් ඇති බවය. එහෙත් ස්වේච්ඡා සංවිධාන වලට එබඳු මෙහෙයයක් ජාතික මට්ටමින් ඉටු කිරීමට ඇති ඉඩකඩ සීමිත නිසා ඒ කාර්යයය සාර්ථක ලෙස ඉටු කරගතහැක්කේ ස්වේච්ඡා සංවිධාන සහ රාජ්‍ය අංශයේ සංවිධාන ඇතුළත් ඒකාබද්ධ ප්‍රයත්නයක් මගිනි. එසේ දියත් කරනු ලබන කිසියම් වැඩ පිළිවෙලක ප්‍රගති සමාලෝචනය පදනම් කරගත අනාගත වැඩ සැළසුම් සම්පාදනය කරගත හැකිය. මෙබඳු ක්‍රියාදාමයකින් අපේක්ෂා කරනුයේ වාරි වාරි මාර්ග කළමනාකරණයට අදාල සියළු කටයුතු මැනවින් සම්බන්ධ කිරීමය.

මෙම කාර්යයේදී රාජ්‍ය අංශයේ සංවිධාන ගොවි ජනතාවගේ ඉලක්ක හා අරමුණු ඉටුකර ගැනීමට තැඩු දෙන නව වැඩ පළුවෙලක් ආරම්භ කිරීම වැදගත් වෙයි. මෙවැන්නක් පැවසීම ඉතා ලෙහෙසි වුවද ක්‍රියාත්මක කිරීම තරමක් දුෂ්කරය. විශේෂයෙන් වාරිජල කළමනාකරණයෙහි ලා නිලධාරි පැළැන්තියට ස්වකීය ක්‍රියා මාර්ග වලින් බැහැරවී කට යුතු කිරීම අසීරු කාර්යයකි. තවද ජල පරිහරණය හා ඊට අදාළ ආයෝජන පිළිබඳව ගොවීන් විසින් තීරණ ගනු ලැබීම නිසා කිසියම් අඩුපාඩුවක් වෙතොත් ඒ නිසා සිදුවන පාඩුවද දරා ගැනීමට සිදු වන්නේ ගොවීන්ටමය.

කෙසේ වුවද වාරි මාර්ග සංවර්ධනය ජාතික ආර්ථික අරමුණු වලට ඉතා සමීප ලෙස සම්බන්ධවී ඇති නිසා දීර්ඝ කාලයක සිට වාරි මාර්ගවල පැවැත්ම රජයෙන් සැපයෙන සම්පත් මතම රඳා පවතී. මෙවන් තත්වයක් යටතේ වාරි මාර්ග පද්ධති කළමනාකරණය වර්ධනය කිරීම මුල්කරගත් වැඩ සටහන් වලදී රාජ්‍ය නිලධාරි තන්ත්‍රය මගින් උපකාරක සේවාවන් පවත්වා ගෙන යාම නොකඩවා සිදු කළ යුතුවේ.

මේ නිසාම වාරි මාර්ග සංවර්ධනයට අදාළ වත්මන් හා අනාගත වැඩ සටහන් වලදී රාජ්‍ය තන්ත්‍රයෙන් ඉටුවිය යුතු මෙහෙය පැහැදිලි කර ගැනීම අවශ්‍ය වී ඇත.

කිසියම් වාරිමාර්ග පද්ධතියක කළමනා කරණ කටයුතු හුදෙක් නිලධාරීන් පමණක් මුල් වීමෙන් ඉටු කරනවාට වඩා ඒ සඳහා ගොවි සහභාගිත්වය ලබා ගැනීම තුලින් වැඩි සාර්ථකත්වයක් ලබා ගත හැකි බව දැනටමත් පැහැදිලි වී තිබේ. නිලධාරි තන්ත්‍රය විසින් කෙටි කාලීනව ලබාගත් අත් දැකීම් පදනම් කරගෙන රජයේ අනුග්‍රහය ලැබෙන විශාල වැඩ පිළිවෙලවල් සැලසුම් කිරීම



ගැටලුවක් විසඳීමට ගොවි නියෝජිතයන් හා නිලධාරීන් අතර සාකච්ඡාවක්

හේතු කොටගෙන අනර්ථකාරී ප්‍රතිඵල ඇතිවූ අවස්ථා ඇත. ගොවීන්ටද ඒ හේතුවෙන් පාඩු සිදුවී ඇත. වාරිමාර්ග පද්ධති කළමනාකරණයෙහිලා ගොවි සහභාගිත්වය ලබාගත් ඇතැම් විශාල යෝජනා ක්‍රම සාර්ථක ලෙස ක්‍රියාත්මක වීමෙන් මෙම කරුණ තවදුරටත් පැහැදිලිවේ.

ලංකාවේ ප්‍රධාන වාරිමාර්ග පද්ධති 35 ක අදාල වන පරිදි ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් දියත් කරන ලද ඒකාබද්ධ මහා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන යටතේ ගොවි සංවිධාන සහ කෘෂිකාමික ක්ෂේත්‍රයට සම්බන්ධ වෙනත් රාජ්‍ය ආයතන වල සාමූහික ප්‍රයත්නය වාරි මාර්ග පද්ධති කළමනාකරණය සඳහා දෙයා යොමුකර ඇත. මෙම කළමනාකරණ කටයුතු සඳහා එක් අක්කරයකට එක් වසරකට රු. 20/ ක් පමණ වූ සුළු මුදලක් පමණක් වැයවනු ඇතැයි ගණන් බලා ඇත.

මෙම වැඩ පිළිවෙලෙහි ප්‍රධාන අරමුණ වන්නේ වාරි පද්ධති කළමනාකරණය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ගොවි සහභාගිත්වය ක්‍රියාශීලිව ලබාගැනීමත් ඒ සඳහා යෝග්‍ය ආයතනික රාමුවක් නිර්මාණය කිරීමත්ය. මෙතෙක් කල් විවිධ රාජ්‍ය ආයතන මගින් ඉටුකල ඇතැම් කාර්යයන් අළුතින් ආරම්භවූ ගොවි සංවිධාන වලට පැවරීමට ප්‍රයත්න දැරූ අවස්ථාව ලදී එල්ලවූ ප්‍රබලතම අභියෝගය වූයේ ගොවි අවශ්‍යතා ඉටුකිරීමට හැකිවන අයුරු නිලධාරි තන්ත්‍රය ප්‍රතිසංවිධානය කළ යුතු වීමය. කෙසේ වුවද එම කාර්යයන් විමධ්‍ය ගත කිරීමේ කටයුතු නිසි ආකාරයෙන් සිදු නොවූව හොත් කළමනාකරණ කටයුතු වලදී ගොවි ජනතාව හා නිලධාරි පැලැන්තිය අතර සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම හුදු අපේක්ෂාවක් පමණක් වනු.

වාරි ජල කළමනාකරණය සඳහා ගොවි සංවිධාන පිහිටුවීම හා වාරි මාර්ග පද්ධති කළමනා කරණය කටයුතු සඳහා එම සංවිධාන හවුල් කර ගැනීමේ අවශ්‍යතාවය අදාල නිලධාරි තන්ත්‍රය තේරුම් ගත යුතුය. මේ කාර්යය සාර්ථක ලෙස ඉටුකර ගැනීම පිණිස ගොවි සංවිධාන වලට වැඩි සැලකිල්ල දක්වමින් නිලධාරි තන්ත්‍රය ක්‍රියා කළ යුතු අතර ගොවි ජනතාවට සුභ සිද්ධියක් සැලසීම ස්වකීය අභිමතාර්ථය කරගත යුතුය.

මේ සියළු ක්‍රියා මාර්ගයන් ගේ අරමුණ විය යුත්තේ කළමනාකරණය උසස් මට්ටමකට පත් කිරීමය. විශේෂයෙන් වාරි මාර්ග පද්ධති කළමනාකරණය නංවාලීම දීර්ඝ කාලීන වශයෙන් රජයේත් ගොවිජනතාවගේත් හිත සුව පිණිස පවතිනුයේ එමගින් පිරිවැය බෙහෙවින් අඩුකර ගැනීමට හැකිවන නිසාය.

වාරි කළමනාකාරිත්වයට ගොවි සහභාගිත්වය ලබා ගැනීම නිසා ගොවි අවශ්‍යතා ඉටුකර ගැනීමට අවස්ථා හිමිවේ. එවිට තෘප්තිමත් වන ගොවි ජනතාව ස්වකීය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා නව නවත් සංවිධානය වනවාත් භාර නිලධාරි තන්ත්‍රය සමගද සහයෝගීව ක්‍රියා කිරීමටත් ඔවුන් අතර සංනිවේදනය දියුණු කර ගැනීමටත් පෙළඹේ. එමගින් කාර්ය සාධනයද මැනවින් සිදුවේ.

ගොවි සංවිධාන කළමනාකාරිත්වය සැම විටම ක්‍රියා කළ යුත්තේ ගොවි සහභාගිත්වයට රුකුලක් ලැබෙන පරිදිය. ගොවි ප්‍රශ්න වලට විසඳුම් සෙවීමේදී නිලධාරි ක්‍රමයට පිටුපා සැම විටම විසඳුම් සෙවීමට උත්සුක වීමත් කළමනාකරණ කුසලතා නංවාලීමත් මෙම වැඩ පිළිවෙල සාර්ථක කර ගැනීමෙහිලා බෙහෙවින් ඉවහල් වනු ඇත. ගොවි සංවිධාන වල ඉලක්කය විය යුත්තේ වාරි ජලය පදනම් කරගත් කෘෂිකාර්මික ප්‍රතිපත්ති සම්පාදනයෙහි සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාශීලී හවුල් කරුවන් බවට පත්වීමය.